# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 41 දරන පොලිස් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 නොවැම්බර් මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 නොවැම්බර් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල: ශත 30 යි　　　　තැපැල් ගාස්තුව: ශත 60 යි

**1984 අංක 41 දරණ පොලිස් (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1984 නොවැම්බර් මස 05 වන දින.]

එල්.ඩී.—ඕ. 45/83

**පොලිස් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1984 අංක 41 දරන පොලිස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. පොලිස් ආඥාපනතේ 77 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 53 වන අධිකාරයේ 77 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය හා (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(1) පෙරහැර ආරම්භවීමට යටත් පිරිසෙයින් පැය හයකට පෙර එම පෙරහැර ආරම්භවීමට නියමිත ස්ථානයට ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත, එම පෙරහැර පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක් භාර දී ඇත්නම් මිස, කිසිම ප්‍රදේශයක යම් ප්‍රසිද්ධ ස්ථානයකින් පෙරහැරක් පිටත් කිරීම හෝ යම් ප්‍රසිද්ධ ස්ථානයක පෙරහැරක් පැවැත්වීම හෝ කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, අමාත්‍යවරයා විසින් සාදනු ලැබ, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, මෙම විධිවිධාන වලින් නිදහස් කරනු ලබන යම් විස්තරයක යම් පෙරහැරක් සම්බන්ධයෙන් මේ උපවගන්තියේ ඉහත සඳහන් විධිවිධාන කිසිවක් අදාළ නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් යම් පෙරහැරක් පිටත් කරන්නා වූ හෝ පවත්වන්නා වූ අවස්ථාවක ඒ පෙරහැර සංවිධානය කරන්නා වූ හෝ ඒ පෙරහැර සංවිධානය කිරීමෙහි නැතහොත් රැස්කිරීමෙහි ලා කිසියම් ක්‍රියාවක් කරන්නා වූ හෝ සෑම තැනැත්තෙක් ද එවැනි යම් පෙරහැරකට සහභාගි වන්නා වූ සෑම තැනැත්තෙක් ද වරදකට වරදකරු වන්නාහ." ;

(ආ) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(5) මේ වගන්තිය යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මහෙස්ත්‍රාත්වරයා සිය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාවේ යෙදවීමේ දී පනවනු ලබන බන්ධනාගාර ගත කිරීමේ කාල සීමාව ඉක්මවන්නේ වුව ද ඒ නොතකා අවුරුදු තුනක් නොඉක්මවන දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.".

පාර්ලිමේන්තුවේ ජනතා කෙටුම්පත්වල සහ කීපිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.